චක්‍රලේඛ අංකය :01/2025

මගේ අංකය :MOJ/AC/22/2025

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

කොළඹ 10.

2025.06. 30

සියළුම මහාධිකරණ විනිසුරුවරුන් / දිසා විනිසුරුවරුන් / මහේස්ත්‍රාත්වරුන්,

<u>රාජසන්තක කරන ලද වැලි, පස්, බොරළු හා දැව ආගමික සිද්ධස්ථාන වෙත බැහැර කිරීම</u>

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක - අමප/25/0828/818/051 දරන 2025 ජුනි මස11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජසන්තක කරන ලද වැලි, පස්, බොරළු හා දැව බැහැර කිරීමේදී 2025.07.01 – 2027.06.30 දින දක්වා පහත උපදෙස් අනුගමනය කල යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

1. රාජසන්තක කරන ලද වැලි, පස්, බොරළු හා දැව ආගමික සිද්ධස්ථාන වලට සහන මිලට ලබා දිය හැකි අතර රාජසන්තක කරන ලද වැලි, පස් හා බොරළු අදාල අධිකරණ මගින්ද, රාජසන්තක කරන ලද දැව රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන වෙත ලබා දීමෙන් අනතුරුව රාජ්‍ය දැව සංස්ථාව මඟින්ද ලබා දිය යුතු වේ. එබැවින් දැව රාජසන්තක කල වහාම රාජ්‍ය දැව සංස්ථාව වෙත ලබා දීමට අධිකරණය විසින් කටයුතු කල යුතුය.

2. ආගමික සිද්ධස්ථානවල වැලි, පස්, බොරළු හා දැව සම්බන්ධ ඉල්ලීම්, අදාල ඉදිකිරීම සිදු කරන ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශ සහිතව ආගමික කටයුතු විෂය භාර අමාත්‍යාංශය වෙත යොමු කල යුතු අතර එම අමාත්‍යාංශය විසින් තම නිර්දේශය සහිතව එකී ඉල්ලීම ප්‍රමුඛතා අනුපිළිවෙලින් කටයුතු කිරීමට අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත යොමු කල යුතුයි.

   (i) ඉහත ආකාරයට වැලි, පස්, බොරළු හා දැව ලබා ගැනීම සම්බන්ධ ඉල්ලීම් සඳහා වන ආකෘති පත්‍ර ඇමුණුම් (01) සහ (02) වශයෙන් www.moj.gov.lk වන අමාත්‍යාංශ වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක.

   (ii) මෙම අමාත්‍යාංශය මඟින් අනුමැතිය දීමෙන් පසු එකී ඉල්ලීමේ ඉදිරි කටයුතු සඳහා අදාළ අධිකරණය වෙත හෝ රාජ්‍ය දැව සංස්ථාව වෙත යොමු කෙරෙනු ඇත.

   (iii) එසේම මෙම අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී දින 180 ක කාලය ඇතුළත රාජසන්තක කරන ලද වැලි, පස් හා බොරළු අදාළ අධිකරණයෙන් ද, රාජසන්තක කරන ලද දැව රාජ්‍ය දැව සංස්ථාව වෙතින් ද ලබා ගත යුතුය.

3. ආගමික සිද්ධස්ථාන වෙත රාජසන්තක කරන ලද වැලි, පස්, බොරළු හා දැව ලබා දීමේ අනුමත සහන මිල ගණන් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| වැලි | - | කියුබ් 01 - රු. 7,500/- (බස්නාහිර පළාත තුළ) |
| | - | කියුබ් 01 - රු. 5,000/- (අනෙකුත් පළාත් සඳහා) |
| පස් හා බොරළු | - | කියුබ් 01 - රු. 1,000/- |
| දැව | - | දැව සඳහා වන දිස්ත්‍රික් මිල කමිටුවල මිල ගණනින් හෝ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ තක්සේරු මිලෙන් 25% ක් අඩු කල මිල |

ඒ අනුව වැලි, පස්, බොරළු ලබා ගැනීමේදි අදාල අධිකරණය වෙත ද, දැව ලබා ගැනිමේදී රාජ්‍ය දැව සංස්ථාව වෙත ද ගෙවීම් කල යුතුය. ලැබෙන ආදායම රජයේ ආදායමට බැර කල යුතුය.

4. ඉහත ආකාරයට සහන මිලට වැලි, පස්, බොරළු හා දැව නිකුත් කිරීමේදී එක් ආගමික සිද්ධස්ථානයක් සඳහා නිකුත් කල හැකි උපරිම සීමාවන් පහත පරිදි වේ.

උපරිම වැලි, පස්, බොරළු ප්‍රමාණය - වර්ෂයකට කියුබ්10

උපරිම දැව ප්‍රමාණය - වර්ෂයකට කියුබික් අඩි 100

ඊට වැඩිවන සෑම වැලි, පස්, බොරළු කියුබ් 01ක් හා සෑම දැව කියුබික් අඩි 01ක් සඳහාම එකී ද්‍රව්‍ය වෙන්දේසියක් පවත්වන අවස්ථාවන්හී දී වෙන්දේසියෙන් තීරණය වන මිලට ලබා දිය යුතුය.

5. රාජසන්තක කරන ලද වැලි, පස්, බොරළු ගොඩගසා ඇති ස්ථානයේ සිට පිටතට ප්‍රවාහනය කිරීමේ දී ද්‍රව්‍ය ලබා ගන්නා පාර්ශවය විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට නියමිත ගාස්තු ගෙවා ප්‍රවාහන බලපත්‍ර ලබා ගත යුතුය.

6. රාජසන්තක කරන ලද දැව සහන මිලට ලබාදීමේදී හා වෙන්දේසි කිරීමේදී රාජ්‍ය දැව සංස්ථා චක්‍රලේඛවල සඳහන් විධිවිධාන එම සංස්ථාව විසින් අනුගමනය කරනු ඇත.

7. අදාල කාල සීමාව තුළ ආගමික සිද්ධස්ථාන වෙත ලබා දි ඉතිරි වන වැලි, පස්, බොරළු අදාල අධිකරණය මගින් ද, දැව රාජ්‍ය දැව සංස්ථාව මගින් ද, සෑම මාස 06කට වරක්ම ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුය.

8. ඉහත ආකාරයට ලබා දුන් වැලි, පස්, බොරළු පිළිබඳ සවිස්තර වාර්තාවක් අදාළ අධිකරණ මගින් ද, දැව පිළිබඳ සවිස්තර වාර්තාවක් අදාළ අධිකරණ වලට ද පිටපත් සහිතව රාජ්‍ය දැව සංස්ථාව මගින් ද , සෑම මාස 03කට වරක්ම මෙම අමාත්‍යාංශය වෙත යොමු කල යුතුය.

**ජනාධිපති නීතිඥ අයෙෂා ජිනසේන**

ලේකම්

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

පිටපත්:

1. ලේකම් - බුද්ධ ශාසන, හා ආගමික සංස්කතික කටයුතු අමාත්‍යාංශය - අ.ක.ස
2. ලේකම් - අධිකරණ සේවා කොමිෂන් සභාව - අ.ක.ස.
3. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - තම දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම සඳහා
4. සාමාන්‍යාධිකාරි - රාජ්‍ය දැව සංස්ථාව - අ.ක.ස., 06, 08 ඡේද කෙරෙහි විශේෂ අවධානය යොමු කරවමි.
5. අධ්‍යක්ෂ ජනරාල් - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය - අ.ක.ස.